Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **9 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2018** **தரம் 9**
**First Term Test 2018** **Grade 9**

**බුද්ධ ධර්මය - I**
**Buddisum - II**

**කාලය :-** පැය දෙකයි
*Two hours*

**සැලකිය යුතුයි:**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- මෙම පළමු ප්‍රශ්න පත්‍රයට සඳහා හිමි මුළු ලකුණු ගණන 40 කි.

ප්‍රශ්න 1 සිට 10 දක්වා ප්‍රශ්න වලට අදළ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. බුදුරජාණන් වහන්සේ **අවසන් වස් කාලය** ගත කළේ,
   (i) බේලුව ගමේ ය. (ii) විශාලා මහනුවර ය. (iii) භෝග නගරයේ ය. (iv) භණ්ඩ ග්‍රාමයේ දී ය.

2. බුදුරජාණන් වහන්සේ **ආයු සංස්කාරය** අත්හැර තෙමසකින් පිරිනිවන් පෑමට තීරණය කළේ,
   (i) බරණැස ඉසිපතනාරාමයේ දී ය. (ii) චාපාලචේතියේ දී ය.
   (iii) ලුම්බිණි සල් උයනේ දී ය. (iv) වේළුවනාරාමයේ දී ය.

3. බුදුරජාණන් වහන්සේට **අවසන් දනය** පූජා කරන ලද්දේ,
   (i) විශාකා සිටු දියණිය යි. (ii) සුදත්ත සිටුතුමා යි.
   (iii) චුන්දකර්මාර පුත්‍රයා යි. (iv) බිම්බිසාර රජතුමා යි

4. බුදුරජාණන් වහන්සේගේ **අවසන් ශ්‍රාවකයා** බවට පත්වූයේ,
   (i) සැරියුත් හිමියන් ය. (ii) මුගලන් හිමින් ය. (iii) සුභද්‍ර හිමියන් ය. (iv) අස්සජි හිමියන් ය.

5. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන්නට පෙර රහත් වීමේ අදිටනින් යුතු ව උත්සාහ කළ භික්ෂුන් වහන්සේ නම්,
   (i) ධර්මාරාම හිමි ය. (ii) ආනන්ද හිමි ය. (iii) මහා කාශ්‍යප හිමි ය. (iv) අනුරුද්ධ හිමි ය.

6. බුදු සිරුරට සත්දිනක් පුදපූජා පවත්වා පසු ව **ආදහනය සිදුකරන ලද ස්ථානය** වන්නේ,
   (i) කිඹුල්වත් නුවර යි. (ii) මකුට බන්ධන ස්ථානය යි.
   (iii) ඉසිපතනාරාමය යි. (iv) රජගහ නුවරයි

7. මහ සඟරුවන **මනා පිළිවෙත් පුරන බැවින්,**
   (i) සුපටිපන්න ය. (ii) උජුපටිපන්න ය. (iii) ඤායපටිපන්න ය. (iv) ආහුනෙය්‍ය ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

8. බුද්ධත්වයෙන් පස්වන වර්ෂයෙහි බක් පොහොය දිනක මැණික් පුටුව වෙනුවෙන් අරගල කළ චූලෝදර මහෝදර නාග ගෝත්‍රිකයන් දමනය සඳහා බුදුන් වහන්සේ වැඩම කරන ලද්දේ,
(i) මහියංගණයට ය. (ii) නාගදීපයට ය. (iii) කැළණියට ය. (iv) දීඝවාපියට ය.

9. අනුරාධපුර අටමස්ථානයට **අයත් වන්නේ**,
(i) තිස්සමහාරාමය යි. (ii) ශ්‍රීපාදස්ථානය යි. (iii) ලංකාරාමය යි. (iv) දිවා ගුහාව යි.

10. සිදුහත් කුමරු විසින් දඹ රුක් සෙවණේ පලග බැඳගෙන වඩන ලද භාවනාව වන්නේ,
(i) මෛත්‍රී භාවනාව යි. (ii) ආනාපානාසති භාවනාව යි.
(iii) බුදුගුණ භාවනාව යි. (iv) පිළිකුල් භාවනාව යි.

ප්‍රශ්න අංක 11සිට 15 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු **වරහන් තුළින් තෝරා ලියන්න.**

( මහා ප්‍රජාපතීගෝතමී දේවිය, චිරරාත්‍රඥ භික්ෂුණින් අතර අගතනතුර, රෝහිණී නදිය, පළමු වසරේ දී ය, අමිතා දේවිය.)

11. බුද්ධ මාතාව යනුවෙන් හඳුන්වනු ලැබූයේ,..........................................................................................................යි.

12. ශාක්‍යයන් හා කෝලියයන් අතර ගැටුමක් ඇති වූ නදිය නම්,..........................................................................වේ.

13. බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ දී මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියට ලබාදුන්

**අග තනතුර වූයේ,**..........................................................................................................යි.

14. යශෝදරා දේවියගේ පියා සුප්පබුද්ධ රජු වූ අතර ඇයගේ **මව වූයේ,**...............................................................යි.

15. බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවරට පළමුවෙන් වැඩම කරන ලද්දේ බුද්ධත්වයෙන්,..............................ය.

ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට **(අ) කොටසට සම්බන්ධ පිළිතුර (ආ) කොටසින් තෝරා යාකරන්න.**

| (අ) කොටස | (ආ) කොටස |
|---|---|
| 16) අභිඥලාභි භික්ෂුණින් අතර අගතනතුර | i) භද්දකච්චානා තෙරණිය |
| 17) ඇසළ පොහෝ දිනය. | ii) මුගලන් හිමියන් |
| 18) කාලසිලාව. | iii) ථූපාර්හ පුද්ගලයන් |
| 19) සීල,සමාධි,ප්‍රඥ. | iv) ත්‍රිවිධ ශික්ෂාව |
| 20 බුදු, පසේබුදු, මහරහත් , සක්විති රජ | v) සංසරත්නය පහල වීම |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **9 ශ්‍රේණිය**

**மூன்றாம் தவணைப் பரீட்சை 2018** **தரம் 9**

**First Term Test 2018** **Grade 9**

**බුද්ධ ධර්මය - II**

**Buddisum - II**

**සැලකිය යුතුයි:**

- **පළමු ප්‍රශ්නය** ඇතුළු **ප්‍රශ්න පහකට** පිළිතුරු සපයන්න
- මෙම දෙවන ප්‍රශ්න පත්‍රයට සඳහා හිමි මුළු ලකුණු ගණන 60 කි.

1. (i) අළාර කාලාම තවුසාගේ ශ්‍රාවකයා නම් කරන්න.

   (ii) සැදැහැතියෙකු දැක සංවේගය උපදවා ගතයුතු ස්ථාන දෙකක් ලියන්න.

   (iii) වයධම්මා සංඛාරා - අප්පමාදේන සම්පාදේථ යන පාඨයේ අදහස ලියන්න.

   (iv) '' තථාකාරී යථාවාදී '' යන්නෙහි අදහස ලියන්න.

   (V) අටලෝ දහමින් දෙකක් දක්වන්න.

   (vi) ''සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා'' යන කවිය සම්පූර්ණ කරන්න.

   (vii) සුදොවුන් රජතුමා සිය පුතුට දෙවන වර වැඳීම සිදු වූ අවස්ථාව සඳහන් කරන්න.

   (viii) කාන්තාවන් හා පිරිමින් භාවනාවට වාඩිවෙන ඉරියව් දෙක වෙන ම ලියා දක්වන්න.

   (ix) බුදු රදුන් යශෝදරා දේවියගේ පතිභක්තිය පැහැදිලි කිරීමට දේශනා කළ ජාතක කතාව ලියා දක්වන්න.

   (x) සතර අගතියෙන් දෙකක් ලියන්න.

2. (i) බුද්ධ චරිතයේ දැකිය හැකි නායකත්ව ලක්ෂණ දෙකක් දක්වන්න.

   (ii) එම ලක්ෂණයන් ගෙන් එකක් කෙටියෙන් හඳුන්වන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(iii) බුද්ධ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ පහක් ලියන්න.

3. (i) සංඝ රත්නයට අයත් ගුණ ගණන කීයද?.

(ii) එම ගුණයන් තුනක් නම් කරන්න.

(iii) සංඝ රත්නයට අප විසින් සිදුකළ යුතු සාමීචි කර්ම පහක් ලියන්න

4. (i) අනුරාධපුර අටමස්ථාන වලින් දෙකක් ලියන්න.

(ii) ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න.

(iii) වට වන්දනාව යනු විස්තර කරන්න.

5. (i) ආන හා අපාන යන්නෙහි අර්ථය ලියන්න.

(ii) භාවනාව පුගුණ කිරීමෙන් සිසුන්ට ලැබෙන ප්‍රයෝජන තුනක් දක්වන්න.

(iii) ආනාපාන සති භාවනාව සිදුකරන ආකාරය කෙටියෙන් හඳුන්වන්න.

6. (i) මහා ප්‍රජාපතී ගෝතමී දේවියගේ දරුවන් දෙදෙනා නම් කරන්න.

(ii) අෂ්ට ගරු ධර්ම වලින් තුනක් ලියන්න.

(iii) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ පහක් දක්වන්න.

7. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී පාද වන්දනාව

(ii) සොළොස්මස්ථානය

(iii) භද්ද කච්චායනා තෙරණිය

(iv) මහා කරුණා ගුණය